# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/04 – 2022 ඔක්තෝබර් 17 වැනි සඳුදා – 2022.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/W/2015/144.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.02.18 දිනැති හා අංක 2215/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තණමල්විල, දෙව්රම් වෙහෙර, අංක 279 හි පදිංචි කේ. පී. ප්‍රේමසිරි මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

කේ. පී. ප්‍රේමසිරි මයා,
අංක 279,
දෙව්රම් වෙහෙර,
තණමල්විල.

*ඉල්ලුම්කරු*

නඩු අංකය: A/21/2021
IR/COM/04/W/2015/144

එදිරිව
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

**තීන්දුව**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වලින් 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියේ කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත නම් සඳහන් පාර්ශ්වකරුවන් අතර වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවකු ලෙස මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් IR/COM/04/W/2015/144 හා 2021/02/10 වැනි දින ඉදිරිපත් කර ඇති ලේඛනයට අනුව මෙම ආරවුලට හේතු වී ඇති කරුණු වන්නේ

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කතරගම ඩිපෝවේ රියැදුරකු වශයෙන් සේවයේ යෙදී සිටි කේ. පී. ප්‍රේමසිරි මහතාගේ,

1. 2011.02.12 දින සිට විනය පරීක්ෂණයකින් තොරව සේවය නතර කිරීම;

2. සේවය නතර කළ 2011.02.12 දින සිට නැවත සේවය පිහිටවූ 2016.08.25 දින දක්වා කාලයට කිසිම සහනයක් ලබා නොදීම;

3. මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් කේ. පී. ප්‍රේමසිරි මහතාට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ''

උක්ත කරුණු සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර සමථයක් පවතින්නේ ද යන කරුණ විමසා සිටි අතර දෙපාර්ශ්වය අතර අවසානයේදී සමථයක් නැති බවට ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මෙම ගැටලුව විමසීමකට නියම කරන ලදී.

ඒ අනුව දෙපාර්ශ්වය විසින් තමාගේ ස්ථාවරය ලිඛිත දේශන මගින් පළමුව ගොනුකොට ඉන්පසුව වාචික දේශන වලට නියම කිරීමට එකඟ වූ බවත්, ඒ අනුව තම ලිඛිත දේශන ගොනු කොට, දෙපාර්ශ්වය විසින් තම වාචික දේශන පැවැත්වූහ.

ඉහත නම් සඳහන් කර ඇති පැමිණිලිකරු ගොනු කොට ඇති ආරාවුලේ දෙපාර්ශවය පිළිගත් කරුණු පහත සඳහන් කර ඇත.

* පැමිණිලිකරු වගඋත්තරකාර සමාගමට සේවයට පැමිණි දිනය

* සේවය කළ කාලය

* කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී පැමිණිලිකරුට එරෙහිව ගොනු කරනු ලැබූ නඩුකරය (B/600/071)

* එම නඩුවේ පැමිණිලිකරුගේ රියැදුරු බලපත්‍රය තාවකාලිකව අත්හිටවූ බව (2011/01/26)

* 2011/07/28 දිනයේ දී පැමිණිලිකරුට තාවකාලිකව රියදුරු බලපත්‍රයක් නිකුත් කළ බව

* 2014/09/11 දිනයේ දී පැමිණිලිකරු B/600/07/11 දරන නඩුවෙන් නිදොස් කොට නිදහස් කෙරූ බව

* ඉන්පසුව පැමිණිලිකරු 2016/08/25 දිනයේ දී නැවත සේවයට අනුයුක්ත කළ බව

* 2017/02/27 දිනයේ දී මෙම පැමිණිලිකරුට එරෙහිව විනය විභාගයක් පැවැත්වූ බවත් (ශ්‍රීලංගම/-ත/විනය/14/2017/01)

* 2017/11/10 වන දින පැමිණිලිකරුට එරෙහිව නියෝගයක් ලබා දුන් බවත්

පැමිණිලිකාර පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ වගඋත්තරකාර සමාගම විසින් තමන්ගේ රියැදුරු බලපත්‍රය තාවකාලිකව අත්හිටවූ අවස්ථාවේදීම තමාට එරෙහිව විනය විභාගයක් පැවැත්වීමට ප්‍රතිපාදන තිබියදීත් එලෙස වගඋත්තරකාර සමාගම විසින් සිදුනොකළ බවටයි.

එයට අදාල වන්නා වූ ප්‍රතිපාදන පැමිණිලිකාර පාර්ශ්වය විසින් තම ලිඛිත දේශනයෙහි A9 ලෙසට අමුණා ඇත. (පාලන පිළිවෙත් අංක 15).

නමුත් වගඋත්තරකාර සමාගම පෙන්වා සිටින්නේ තම සමාගම විසින් 2011/02/12 වැනි දින ලිපිය පරිදි පැමිණිලිකරු සේවයෙන් බැහැර කර තිබුණු බවත්, පැමිණිලිකරුට අවශ්‍ය නම් ලිපියේ දින සිට මසක් ඇතුළත අභියාචනයක් කළ හැකි බවත් ය. නමුත් පැමිණිලිකාර පාර්ශ්වයෙන් අභියාචනයක් සිදුනොකළ බව තවදුරටත් වගඋත්තරකාර සමාගමෙන් ප්‍රකාශ කර සිටියි. (ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලීය විනය ව්‍යවස්ථා මාලාව 20.1, සහ 20.2, R1 සහ R2 ලෙස වගඋත්තරකරු තම ලිඛිත දේශනයේ සලකුණු කොට ඇත).

කෙසේ නමුත් මාගේ අවධානය යොමුවන්නේ පහත කරුණු දෙසට ය.

1. 2011/02/12 දිනැති ලිපියෙන් පැමිණිලිකරුගේ සේවය විනය පරීක්ෂණයකින් තොරව බැහැර කර සිටියත්, 2016/08/25 වන දින පැමිණිලිකරුව නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කර සිටීම.

2. පැමිණිලිකාර පාර්ශ්වය සේවයේ නැවත ප්‍රතිෂ්ඨාපනය කළපසුව 2017/02/27 දිනයේ දී මෙම පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කළ බවත්, එම පරීක්ෂණය 2011/01/26 සිදුවීමට අදාළ පරීක්ෂණයක් බවත්ය (R7 ලේඛනය).

    i. එම R7 දරන චෝදනා පත්‍රයේ සඳහන් කර ඇති ලේඛන නැතහොත් ''ඉදිරිපත්කිරීම්'' යටතට පැමිණිලිකරුට එරෙහිව ගොනු කර ඇති B/600/7/11 දරන නඩුව ගැන කිසිදු සඳහනක් නැති බව පෙනී යයි.

    ii. තවද 2017 වර්ෂය වන තෙක් මෙවැනි පරීක්ෂණයක් කල් තැබීම සම්බන්ධයෙන් සාධාරණ තර්කයක් වගඋත්තරකාර සමාගමෙන් මතු කොට ඇත් ද?

ඉහත සඳහන් සියලු කරුණු සලකා බැලීමෙන් මා පහත නිගමනයන්ට එළඹ ඇත.

(i) 2011/01/26 දින දී පැමිණිලිකාර පාර්ශ්වයට එරෙහිව ඔහුගේ රියැදුරු බලපත්‍රය තාවකාලිකව අවලංගු කිරීම සම්බන්ධව වගඋත්තරකාර සමාගම විසින් පාලන පිළිවෙත් අංක 15 හි සඳහන් අයුරින් ස්වාධීන විනය පරීක්ෂණයක් සිදු නොකොට ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාව ප්‍රකාරව පැමිණිලිකරු සේවයෙන් බැහැර කිරීමේ නියෝගයක් ලබා දී ඇති බවත්, එය නිසි ක්‍රියා පටිපාටියකට සිදු නොවූ හෙයින් මෙම 2011/02/12 දිනැති තීන්දුව සාධාරණ තීන්දුවක් නොවන බවත්,

(ii) මෙම පැමිණිලිකරුව 2016/08/25 නැවත සේවයේ ප්‍රතිස්ථාපනය කර ඇති බවත්, ඔහුට එරෙහිව ගොනු කර ඇති B/600/7/11 දරන කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණ නඩුවෙන් මෙම නඩුවේ පැමිණිලිකාර පාර්ශ්වය නිදොස් කොට නිදහස් කළ බවත්, එම නිසා 2011/02/12 සිට 2016/08/25 දක්වා වගඋත්තරකාර පාර්ශ්වය විසින් කිසිදු සහනයක් පැමිණිලිකරුට ලබා නොදීම නිසා පැමිණිලිකරුට මහත් අගතියක් සිදුවී ඇති බවත් පෙනීයයි.

ඒ අනුව මෙම ආරාවුලේ පැමිණිලිකාර පාර්ශ්වයට වගඋත්තරකාර පාර්ශ්වය විසින් අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරන බවත් එම නඩුවේ පැමිණිලිකාර පාර්ශ්වයට පහත සඳහන් අයුරින් ගෙවීම් සිදු කර එම සේවා කාලය අඛණ්ඩ සේවා කාලයට ඇතුළත් කිරීමට නියෝග කරමි.

**ප්‍රදානයයි**

(1) මෙම ප්‍රදානය නඩුවේ පැමිණිලිකරු වෙනුවෙන් 2011/02/12 දින සිට 2016/08/25 දින දක්වා වූ කාලයේදී නොගෙවූ වැටුප් වශයෙන් සලකන ලෙසත් පහත දක්වා ඇති අයුරින් ගෙවීම් සිදුකරන ලෙසත් නියෝග කර සිටිමි.

මාසික වැටුප - රු. 27,713.53
2011/02/12 සිට 2016/08/25 (මාස 66 දින 13) දක්වා හිඟ වැටුප

ගෙවිය යුතු මුලු මුදල = රු. 1,841,102.17

(2) උක්ත සඳහන් හිඟ මුදල ගැසට් ගත කිරීමෙන් මාස තුනක් ඇතුලත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට තැන්පත් කළ යුතුයි.

තවද ව්‍යවස්ථාපිත හිමිකම් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්ට ඉල්ලීමක් කිරීමට බාධාවක් නොවන අතර මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට වැඩිදුරටත් සඳහන් කර සිටිමි.

නීතිඥ මලින්ත ජයසිංහ,
බේරුම්කරු.

2022 අගෝස්තු මස 8 වැනි දින.

EOG 10-0152

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.